www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියාවඃ සුනාමි අනතුරු හැඟවීම් කල හැකිව තිබුනි.

## India: Tsunami warnings could have been made

**ගනේෂ් දේව් විසිනි**
**2005 ජනවාරි 10**

---

දෙසැම්බර් 26 දා සුනාමිය, ඉන්දියාවේ නැගෙනහිර වෙරලට කඩා වැදීමෙන් ද බෙංගාල බොක්කේ අන්දමන් සහ නිකොබාර් දූපත් ගිල ගැනීමෙන් ද දහස් ගනනක් මිය ගොස් හෝ නිවාස අහිමිව ඇත. ඉන්දියානු දේශපාලන සංස්ථාපිතයේ ප්‍රතිචාරය පෙන්නුම් කරන්නේ මෙහි ප්‍රධාන ගොදුරු බවට පත් වූ දරිද්‍රතාවෙන් පෙලෙන ගම්වැසියන් හා ධීවරයන් කෙරෙහි එහි (දේශපාලන සංස්ථාපිතයේ) උදාසීනත්වය සහ පිලිකුලයි.

නව දිල්ලියේ එක්සත් ප්‍රගතිශීලි සන්ධාන ආන්ඩුව (යූපීඒ) සමග එක්වූ තමිල්නාඩු, ආන්ද්‍රා ප්‍රදේශ්, පොන්ඩිචෙරි හා කේරල ප්‍රාන්ත ආන්ඩු ද, තමන් සුනාමිය පිලිබඳව නො දැන සිටි බවත් ජීවිත බේරා ගැනීම සඳහා කිසිවක් කල හැකිව නො තිබූ බවත් අවධාරනය කොට ඇත. පැසිෆික් සාගරය මෙන් ඉන්දියන් සාගරය නිරන්තර සුනාමි තත්වයන් අත් දැක නැති බව අවධාරනය කිරීම මගින් ඔවුහු සුනාමි අනතුරු හැඟවුම් පද්ධතියක් නොමැති වීම යුක්තිසහගත කරති.

පොන්ඩිචෙරි හි නලබාඩු නම් කුඩා මුහුදු බඩ ගම්මානයේ සිද්ධීන් විසින් මෙම සාධාරනීකරනයේ හිස් බව තියුනු අවධානයකට යොමු කරයි. සිදුවීමට නියමිත සුනාමි තත්වය පිලිබඳව අනතුරු හඟවමින් කල්තියා ලැබුනු දුරකතන ඇමතුමකින් එම ගම්මානයේ පදිංචිකරුවන් 3600ක ගේ ද අසල්වාසී ගම්මාන තුනේ පදිංචිකරුවන්ගේ ද දිවි රැකදුන්නේ ය.

එම්.එස්. ස්වාමිනාදන් පර්යේෂන පදනමේ ගම්මාන තොරතුරු පර්යේෂන වැඩ සටහනට නලවාඩු ගම ද සම්බන්ධ කර තිබුනි. ව්‍යාපෘතියේ හිටපු ස්වේච්ඡා සේවකයකු වන විජයකුමාර්ට සිංගප්පූරුවේ වැඩ කරමින් සිටින අතර එහි දී නිකුත් කරනු ලැබූ සුනාමි අනතුරු හැඟවුමක් අසන්නට ලැබුනි. ඔහු වහාම ගම්මානයේ පර්යේෂන මධ්‍යස්ථානයට දුරකථනයෙන් කතා කල අතර මධ්‍යස්ථානය අනතුරු හැඟවුමක් නිකුත් කලේ ය. ඔහුගේ ක්ෂනික සිතුවිල්ල සමග එක්ව ගත් ක්ෂනික ක්‍රියාමාර්ග නිසා සුනාමිය වෙරලට කඩාවැදීමට පෙර ගම්මාන හතර ඉවත් කර ගැනීමට හැකියාව ලැබුනි.

සිංගප්පුරුව මෙන් ඉන්දියාව ද පිහිටුවා තිබූ සුනාමි අනතුරු හැඟවුම් පද්ධතියක සාමාජිකයකු වූවා නම් ජීවිත හානිවලින් බහුතරයක් වලක්වා ගත හැකිව තිබුනි. එවැනි ජාලයකින් තොරව පවා ඉන්දියානු බලධාරීන් ප්‍රතිචාර දැක්වීමට අසමත් වූ අන්තරාදායක හැඟවීම් පැවතුනි. සුනාමිය දකුනු ඉන්දීය වෙරල තීරයට කඩා වැදීමට බොහෝ වේලාවකට පෙර බෙංගාල බොක්කේ හුදෙකලාව පවතින ඉන්දීය අන්දමන් හා නිකොබාර් දූපත්, යෝධ තරංග මගින් යටකරගනු ලැබ තිබිනි.

සුමාත්‍රා වෙරලේ මුහුද යට භූචලන සිදු වූයේ ඉන්දීය වේලාවෙන් උදෑසන 6.29ට ය. සුනාමිය මුදාහරිනු ලැබුවේ එම භූ චලනය විසිනි. විනාඩි 50 කට පසුව උදෑසන 7.19ට භූචලනයේ පසු කම්පනයක් අන්දමන් හා නිකොබාර් දූපත් දෙදරවාලී ය. මිනිත්තු 11කට පසුව උදෑසන 7.30ට ඉන්දියාවේ ගුවන් හමුදාවට කාර් නිකොබාර්හි ධාවන පථයෙන් අනතුරු හැඟවීමක් ලැබිනි. දූපත් පෙල සමග සන්නිවේදනය තාවකාලිකව ඇන හිටියේ එයිනුත් පසුව ය.

කෙසේ වුව ද උදෑසන 7.50ට ඉන්දීය ගුවන් හමුදාවේ චෙන්නායි ඒකකය අධි බලැති ගුවන් විදුලි පනිවුඩයක් මගින් කාර් නිකොබාර් සම්බන්ධ කර ගත්තේ ය. දූපතේ රඳවනු ලැබ සිටි ගුවන් හමුදා භටයන් 25 දෙනා තමන් ද, තමගේ දරු පවුල් ද, සුනාමිය විසින් බිලිගැනීමට පෙර එවනු ලැබූ අවසාන හදිසි පනිවුඩය වූයේ ''දූපත ගිලෙමින් තිබෙනවා හැම තැනම වතුර'' යන්න ය.

IRS-P4 සහ IRS - P6 යන ඉන්දියානු චන්ද්‍රිකා උදෑසන 7.30ත් 7.50ත් අතර කාර් නිකොබාර් වෙත ප්‍රචන්ඩ ලෙස කඩා වැදුනු තරංග ඡායාරූප ගත කලේ ය. චන්ද්‍රිකා ඡායාරූප බොහෝ මුහුදු වෙරලවල් ඔස්සේ ඇතුලට පැමිනෙන සුනාමිය පෙන්නුම් කරයි.

ඉන්දීය වෙරලබඩ ජනතාව වෙත යම් ආකාරයක අනතුරු හැඟවීමක් කිරීමට කාලය තිබුනු බව පැහැදිලි ය. උදෑසන 8.32ට ගනු ලැබූ චන්ද්‍රිකා ඡායාරූප මදුරාසිය අවට වෙරලට කඩාවදිනු ද අද්යාර් ගංමෝය තුලින් ඇතුලට ගලාගිය ආකාරය ද, පෙන්වා තිබුනි. ප්‍රථම තරංගයෙන් පසුව තවත් තරංග 4ක් පැමිනුනි. දෙවැන්න 9.20ටත්, තෙවැන්න 10.20ටත්, සිව්වැන්න 10.40ටත් අවසාන එක 11.00ටත් වසයෙනි.

නිල ප්‍රතිචාරය නොහැකියාවේ හා උදාසීනත්වයේ සංයුතියක් විය. *ඉන්දියන් එක්ස්ප්‍රස්* හි පල වූ වාර්තාවකට අනුව ඉන්දියානු ගුවන් හමුදා ප්‍රධානී එස්.

ක්‍රිෂ්නස්වාමි අවසානයේ දී නවදිල්ලියේ බලධාරීන් සම්බන්ධ කර ගැනීමට උත්සාහ දැරී ය. ඔහුගේ සහායකයා හිටපු විද්‍යා හා තාක්ෂන ඇමතිවරයාගේ නිවසට ෆැක්ස් පනිවුඩයක් යැවී ය. ඉන් එහා පියවරයක් ගනු නො ලැබින.

දෙවන තරංගය මදුරාසියට හා තමිල්නඩුවේ දකුනු වෙරලට පැමින විනාඩි දෙකක් ගත වන තුරුත් එක්සත් ප්‍රගතිශීලි සන්ධාන ආන්ඩුවේ කැබිනට් ලේකම්ගේ පුද්ගලික ලේකම්ට සුනාමිය පිලිබඳව දන්වනු නො ලැබී ය. කැබිනට් ලේකම් කාර්යාල නිලධාරීන්ට දන්වනු ලැබුවේ පෙ.ව. 10.20ට ය.

අවසාන තරංගය ඉන්දියාවට පැමින පැය දෙකක් ගත වනතෙක් හා ගුවන් හමුදාවට කාර් නිකොබාර් ගුවන් කඳවුරෙන් කෙටි පනිවුඩය ලැබී පැය පහක් ගත වන තෙක් ම - එනම් පස්වරු 1.00 දක්වා - ආන්ඩුවේ ප්‍රධාන හදිසි ප්‍රතිචාර ඒකකය වන අර්බුද කලමනාකරන කන්ඩායම රැස් වී නොතිබිනි. නමුත් ඒ වන විට බොහෝ ප්‍රමාද ය.

සුනාමියෙන් පසුව අනතුරු හැඟවීමට හා ජීවිත බේරා ගැනීමට අසමත් වීම සාධාරනීකරනය කිරීම සඳහා විවිධ ඉන්දියානු නිලධාරීහු උත්සාහ දරා ඇත.

ඉන්දීය කාලගුන විද්‍යා දෙපාර්තමේන්තුවේ භූකම්පන විද්‍යා අධ්‍යක්ෂ ආර්.එස්. ධතත්‍රයාම් ඉන්දියන් එක්ස්ප්‍රස් පුවත් පතට කියා සිටියේ, ''ඉන්දීය ඉතිහාසය තුල කිසිදාක සුනාමි තත්වයක් වාර්තා වී නැත, එමනිසා අපට සූදානම් වීමට හැකි අයුරින් එය ඇති වූයේ නැත.'' ජනවාරි 3 දා පැවති පුවත් පත් සාකච්ඡාවක දී අගමැති මන්මෝහන් සිං ඒ හා සමාන කතාවක් කලේ ය. "සුනාමිය රට අත්දැක නො තිබූ නව ප්‍රපංචයකි'' යි ඔහු සඳහන් කලේ ය.

නමුත් ඓතිහාසික වාර්තාව ඊට වෙනස් ය. සුනාමි තත්වයන්, පැසිෆික් සාගරයේ තරම් බහුල නැතත්, ව්‍යසනකාරී ප්‍රතිවිපාකයන් ගෙන දෙමින් ඉන්දියන් සාගරය තුල ද මීට පෙර සුනාමි හට ගෙන තිබේ. හොඳම උදාහරනය වන්නේ කලාපය පුරා 36,000ක් ජනයාට මරු කැඳවමින් දකුනු සුමාත්‍රාව අසල ක්‍රැකටෝවා දූපතේ 1883 දී සිදු වූ ගිනිකඳු පුපුරා යාම මගින් ජනිත කල තරංගයයි. එයට ඉන්දියාව ද ඇතුලත් විය. ඊට වසර දෙකකට පෙර 1881 දෙසැම්බර් 31 දා කාර් නිකොබාර් දූපතේ ඇති වූ රික්ටර් පරිමානයේ 7.5ක් ලෙස සටහන් වූ භූ චලනය ද සුනාමි තත්වයක් ජනනය කලේ ය.

ඉතා මෑත උදාරහන ද පවතී. *කරන්ට් සයන්ස්* (Current Science) නම් විද්‍යාත්මක සඟරාවේ පසුගිය වසරේ පලකල පත්‍රිකාවකට අනුව 1941 ජූනි 26 දින සිදු වූ රික්ටර් පරිමානයේ 7.5-8.5 අතර සටහන් වූ භූචලනය සුනාමි තත්වයක් ජනනය කලේ ය. එය විශාල දේපල හා ජීවිත හානියක් සිදු කරමින් අන්දමන් දූපත් හි බටහිර වෙරල ගිලගත් අතර ඉන්දියානු වෙරලට ද කඩා වැදුනි. එම භූචලනය මගින්, බ්‍රිතාන්‍ය බලධාරීහු යටත් විජිත පාලනයේ දේශපාලන විරුද්ධවාදීන් සිරගත කොට තැබූ කුප්‍රකට සෙලියුලර් ජේල් හි මධ්‍යම කුලුන බිඳ දමමින් ඉමහත් විනාශයක් අන්දමන් දූපත්වලට සිදු කෙරිනි.

පූනායි හි භූකම්පන විද්‍යාඥයෙක් වන ආචාර්ය අරුන් බපාට් *ද වීක්* සඟරාවට විස්තර කලේ ඉන්දියාවේ නැගෙනහිර වෙරල, අන්දමන් හා නිකොබාර් දූපත් පමනක් නො ව ඉන්දියාවේ බටහිර වෙරල ද සුනාමි තත්වයන්ට මුහුන දී ඇති බව යි. 1945 නොවැම්බර් 27 දා අරාබි මුහුදේ ඇති වූ 8.25 පරිමානයේ භූචලනයක් ඉන්දියානු බටහිර වෙරල තීරයේ විශාල තරංග ජනනය කලේ ය. භූ චලනයන් හා සුනාමි තත්වයන් ජනනය කල හැකි ඉන්දියන් සාගරය තුල පිහිටි අනෙකුත් අන්තරාදායක විය හැකි කලාපයන් වෙත ද ඔහු තම අවධානය යොමු කලේ ය.

ඉන්දියන් සාගරය තුල සුනාමි තත්වයන් සුලභ නැති බව ප්‍රතික්ෂේප නො කෙරේ. එහෙත් පසුගිය දෙසතියේ සිද්ධීන් පෙන්නුම් කරන්නේ, දීර්ඝ කාලීන අන්තරායන් නො සලකා හැරීම සාපරාධී නොතකා හැරීමකට සමාන වන බව යි. සුනාමි අනතුරු හැඟවුම් පද්ධතියක් සඳහා යෙදීමට සිදුවන්නේ සාපේක්ෂව දැරිය හැකි පිරිවැයක් වන අතර එවැන්නක් නොමැතිකමෙන් ජීවිත දස දහස් ගනනක් නැති වී මිලියන ගනනක් විපතට පත්ව ඇත. මෙහි වගකීම නව දිල්ලිය ද ඇතුලත් කලාපීය ආන්ඩු මත ද සියල්ලටමත් වඩා එවැනි (අනතුරු හැඟවුම්) ජාලයක් ස්ථාපනය කරන ලෙස විද්‍යාඥයන් කල ඉල්ලීම් නො තකා හල මහා බලවතුන් මත ද රැඳී ඇත.

© www.wsws.org